# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 9 දරන
# රත්නපුර බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 පෙබරවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 65 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1983 අංක 9 දරන රත්නපුර බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 පෙබරවාරි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 24/82.

**රත්නපුර බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සීමාසහිත රත්නපුර බෞද්ධ සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 9 දරන රත්නපුර බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාසහිත රත්නපුර බෞද්ධ සමිතියේ දැනට සාමාජිකයන් වූ සියලු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝද, මේ පනත ආරම්භ වන දින සිට හා ඉන්පසු "රත්නපුර බෞද්ධ සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන, එය පාවිච්චි කිරීමේ ද සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ යුතුද කළ හැකිද වන්නේ ය. රත්නපුර බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා වේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බුද්ධාගම අධ්‍යයනය කිරීම ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම;

(ආ) බෞද්ධයන් අතර එක්සත්කම සහ සහයෝගය ඇති කිරීම;

(ඇ) බුද්ධාගම අභිවර්ධනය කිරීම සඳහා අනෙකුත් බෞද්ධ සමිති සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඈ) බෞද්ධ ප්‍රතිපත්ති රැකීම සඳහා ධෛර්යයදීම සහ බුද්ධාගම පතුරුවා හැරීම;

(ඉ) සාමාජිකයන්ගේ ශාරීරික, බුද්ධිමය සහ සමාජයීය ශුභ සිද්ධිය දියුණු කිරීම උදෙසා කටයුතු කිරීම; සහ

2—ඒ 63769—11,800 (82/05)

(ඊ) රත්නපුර දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින දක්ෂවූත් බුද්ධිමත් වූත් උසස් අධ්‍යාපනය ලැබීමට සුදුසු නමුත් තම ආර්ථික තත්ත්වය අනුව එසේ කිරීමට අපොහොසත් වන්නා වූත් බෞද්ධ ශිෂ්‍යයන්ට සහ භික්ෂූන්ට මුදලින් ආධාර සැපයීම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

පාලක මණ්ඩලය.

4. (1) නිල බලයෙන් සාමාජිකත්වය ලබන්නා වූ සංස්ථාවේ සභාපතිවරයා සහ රත්නපුර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලයේ සභාපතිවරයා යන දෙදෙනා ඇතුළුව සාමාජිකයන් දොළොස් දෙනකු ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් සංස්ථාවට තිබිය යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී සමිතියේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වන පහත දැක්වෙන සාමාජික යන්ගෙන් සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය සමන්විත විය යුතුය :—

1. ගරු ආර්. ඇස්. වනසුන්දර මහතා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ;
2. ගරු ටී. ඒ. ඩී. අතුකෝරළ මහතා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ;
3. හැරල්ඩ් වේරගම මහතා ;
4. ජී. ඇස්. මාරපන මහතා ;
5. ඒ. පී. බී. මනම්පේරි මහතා ;
6. ඒ. ඇම්. බී. වැලිගෙපොල මහතා ;
7. ඩබ්ලිව්. කේ. ප්‍රේමරත්න මහතා ;
8. එච්. ඩී. එච්. විජේගුණරත්න මහතා ;
9. බී. එච්. බුලත්සිංහල මහතා ;
10. හැරී වීරසේකර මහතා ;

නිල බලයෙන්

11. සීමාසහිත රත්නපුර බෞද්ධ සමිතියේ සභාපති ඇනට එම ධූරය දරන ජී. කේ. රත්නසේකර මහතා ;
12. රත්නපුර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලයේ සභාපති දනට එම ධූරය දරන පී. මාරපන මහතා.

(3) නිල බලයෙන් සාමාජිකත්වය දරන්නා වූ සංස්ථාවේ සාමාජිකයන් හැර, පාලක මණ්ඩලයේ ඇති වන යම් පුරප්පාඩුවක්, පාලක මණ්ඩලයේ සෙසු සාමාජිකයන්ගේ අනුමතිය ඇතිව, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී පුරවනු ලැබිය යුතුය.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලැබිය යුතු වූ ද එකී රීතිවල විධිවිධාන මගින් නියම කර ඇත්තා වූ ද වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත වූ කළමනාකාර කාරක සභාවක් විසින්, එකී රීතිවලට යටත්ව, පාලනය කරනු ලැබිය යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී නිල දැරූ සමිතියේ කළමනාකාර කාරක සභාව සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කාරක සභාව විය යුතුය.

මණ්ඩල පිහිටුවීම.

6. සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථවලින් කවර වුවද පරමාර්ථ එකක් හෝ වැඩි ගණනක් ඉටු කිරීම සඳහා අනුයාත මණ්ඩල කිසිවක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබීම නීත්‍යනුකූල වන්නේය.

රත්නපුර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලය.

7. (1) සමිතිය විසින් දැනට පිහිටුවා තිබෙන (මෙහි මින් මතු "අධ්‍යාපන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) රත්නපුර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලය නොකඩවම ක්‍රියාත්මකව පවත්වාගෙන යා යුතු අතර, ස්වකීය රීති හා නියෝග සෑදීමේ බලය ඊට ඇත්තේය.

(2) අධ්‍යාපන මණ්ඩලය විසින් එකතු කරනු ලබන සියලු මුදල් ඒ මණ්ඩලයේ නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හෝ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් බැංකුවක හෝ ස්ථාවර තැන්පතු වශයෙන් තැන්පත් කරනු ලැබිය යුතු අතර, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධ්‍යාපන මණ්ඩලයේ තනි පාලනයට යටත් වන්නේය.

(3) පාලක මණ්ඩලයේ ලිඛිත කැමැත්ත සහ අනුමතය නොමැතිව අධ්‍යාපන මණ්ඩලය විසින්, එහි බැරට ඇති ස්ථාවර තැන්පතු වලින් කිසිදු මුදල් ප්‍රමාණයක් ආපසු ලබා නොගත යුතුය:

එසේ වුවද එකී ස්ථාවර තැන්පතු සඳහා එකතුවන පොලිය පාලක මණ්ඩලයේ අනුමතය නොමැතිව මුදලින් ආධාර දීම, ශිෂ්‍යත්ව මුදල් සහ වෙනත් ආනුෂංගික වියදම් දැරීම සඳහා වියදම් කිරීමේ අයිතිය අධ්‍යාපන මණ්ඩලයට ඇත්තේය.

පාලක මණ්ඩලයේ බලතල.

8. පාලක මණ්ඩලයේ ලිඛිත කැමැත්ත සහ අනුමතිය ලබා නොගෙන සංස්ථාව විසින්—

(අ) සංස්ථාවට අයත් කවර වුවද දේපළක් විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ නියාදනය කිරීම ;

(ආ) සංස්ථාවට අයත් දේපළ කිසිවක් අවුරුද්දකට වැඩි කාලය කට බදු දීම හෝ ඒ දේපළම යම් තදනන්තර කාල පරිච්ඡේදයකට බදු දීම ;

(ඇ) කවර වුවද ව්‍යාපෘතියක් සඳහා හෝ කවර වුවද කාර්යයක් සඳහා එක් අවුරුද්දක් තුළ දී රුපියල් විසිපන් දහසකට වැඩි මුදලක් වියදම් කිරීම

නොකළ යුතුය :

එසේ වුවද, මුදලින් ආධාර දීම, ශිෂ්‍යත්ව මුදල් ගෙවීම සහ වෙනත් ආනුෂංගික වියදම් දැරීම සඳහා ස්ථාවර තැන්පතුවලින් එකතු වන පොලිය යෙදීමෙහි ලා අධ්‍යාපන මණ්ඩලය වෙත මේ ඡේදයේ විධිවිධාන බල නොපාන්නේය.

රීති සෑදීමේ බලය.

**9.** සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද නිලධරයන්, කළමනාකාර කාරක සභාව සහ පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීම සහ ඉවත් කිරීම සඳහා ද සංස්ථාවේ නිලධරයන්ගේ, කළමනාකාර කාරක සභාවේ, පාලක මණ්ඩලයේ, කාර්ය මණ්ඩලයේ, නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන්ද සංස්ථාවේ පරමාර්ථ එකක් හෝ ඊට වැඩි ගණනක් ඉටු කිරීම පිණිස සංස්ථාවට අනුයාත මණ්ඩල පිහිටුවීම සඳහා සහ ඒ මණ්ඩලවල බලතල හා කාර්ය නිරණය කිරීම සඳහා ද මේ හැර සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා ද මේ පනතේ ප්‍රතිපත්තිවලට සහ විධිවිධානවලට අනනුකූල නොවන රීති, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීමේ බලය සංස්ථාවට ඇත්තේය. එසේ සාදන ලද රීති, 11 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, වෙනස් කිරීම, ඒවාට අලුතින් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

උපලේඛනයේ දක්වා ඇති රීති සංස්ථාවේ රීති විය යුතු බව.

**10.** මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති රීති, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සියලු කාර්ය සඳහා සංස්ථාවේ රීති වන්නේ ය :

එසේ වුවද, යම් මහා සභා රැස්වීමකදී අලුත් රීති සෑදීමෙන් හෝ එකී උපලේඛනයේ දක්වා ඇති රීති කිසිවක් වෙනස් කිරීමෙන්, සංශෝධනය කිරීමෙන්, ඒවාට අලුතින් යමක් එකතු කිරීමෙන් මේ වගන්තියේ අඩංගු කිසිවක් මගින් සංස්ථාව වළක්වාලන බවක් තේරුම් ගැනීම හෝ එසේ සැලකීම හෝ නොකළ යුතුය.

රීති සංශෝධනය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය.

**11.** මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති යම් රීතියක් හෝ මින් මතු සාදනු ලබන යම් රීතියක්, තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් විනා වෙනස් කිරීම, සංශෝධනය කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම, පහත දැක්වෙන පරිදි හැර නොකරනු ලැබිය යුතුය :—

(අ) ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළමනාකාර කාරක සභාව විසින් කලින් අනුමත කරනු ලැබිය යුතුය ; සහ

(ආ) පාලක මණ්ඩලයේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට අදාළ යම් රීතියකට අලුතින් කිසිවක් එකතු කිරීම, එය වෙනස් කිරීම, සංශෝධනය කිරීම, හෝ පරිච්ඡින්න කිරීම සම්බන්ධයෙන් වූ අවස්ථාවක දී ඒ එකතු කිරීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම පාලක මණ්ඩලය විසින් කලින් අනුමත කරනු ලැබිය යුතුය.

12. තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව පාලක මණ්ඩලය, සංස්ථාව හෝ අධ්‍යාපන මණ්ඩලය විසින් ගනු ලැබූ යම් තීරණයක්, අවසානාත්මක සහ තීරණාත්මක වන අතර, සියලු සාමාජිකයන් ඒ තීරණයෙන් බැඳී සිටිය යුතුය. ගනු ලැබූ තීරණයේ අවසානාත්මක බව.

13. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේදී සමිතියේ නාමයෙන් සමිතියට අයත් වූ හෝ යම් තැනැත්තකුගේ නැතහොත් තැනැත්තන්ගේ නමින් භාරයක් වශයෙන් සමිතිය විසින් දරන ලද හෝ චංචල සහ නිශ්චල සියලු දේපළ, මෙයින් සංස්ථාපනය කරන ලද සංස්ථාව වෙත පැවරෙන අතර එම දේපළ, සංස්ථාව වෙත මෙයින් පවරා දෙනු ලැබිය යුතුය. සංස්ථාව වෙත දේපළ පැවරීම.

14. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේදී සමිතියේ පවත්නා සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සමිතියට අය විය යුතු සියලුම ණය සහ සමිතිය වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය. සමිතියෙන් ගෙවිය යුතු හා සමිතියට අය විය යුතු ණය.

15. සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා සහ කළමනාකාර කාරක සභාවේ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

16. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනිමටත් දැරීමටත් නීතියෙහි ලා හැකියාව හා ශක්තතාව සංස්ථාවට ඇත්තේ ය. තවද, එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන්‍යාකාරය කින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, භාරගැනීමේ සහ දැරීමේ හැකියාව සහ බලය නීතියෙන් සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

17. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

## උපලේඛනය

### රත්නපුර බෞද්ධ සමිතියේ රීති

**සාමාජිකත්වය.**

1. (1) සමිතියේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහි ලා අවශ්‍යයෙන් ම උනන්දුවක් දක්වන සියලු බෞද්ධයෝ සමිතියේ සාමාජිකත්වයට සුදුස්සෝ වෙති.

(2) සාමාජිකත්වය, සාමාන්‍ය සාමාජිකයන් සහ යාවජීව සාමාජිකයන් යනුවෙන් වර්ග දෙකකට බෙදනු ලැබේ.

(3) සාමාන්‍ය සාමාජිකයන් විසින් මසකට රුපියල් දෙක බැගින් වූ අවම දායක මුදලක් ගෙවිය යුතුය.

(4) පහත සඳහන් තැනැත්තන්, එනම්—

(අ) සමිතියට විශිෂ්ට සේවයක් කළ යම් තැනැත්තකු ;

(ආ) සමිතියට රුපියල් පන්සියයක් හෝ ඊට වැඩි මුදලක් ගෙවන යම් තැනැත්තකු

සමිතියේ යාවජීව සාමාජිකයකු වශයෙන් කළමනාකාර කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය.

(5) අධ්‍යාපන මණ්ඩලයට රුපියල් පන්දහසක් හෝ ඊට වැඩි මුදලක් පරිත්‍යාග කළ ඒ මණ්ඩලයේ සියලු සාමාජිකයන් සමිතියේ යාවජීව සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) සාමාන්‍ය සාමාජිකයන් සතු සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද සියලුම යාවජීව සාමාජිකයන්ට ඇත්තේ ය.

**සාමාජිකත්වය සඳහා ඉල්ලීම.**

2. (1) සාමාජිකත්වය සඳහා වූ හැම ඉල්ලීමක්ම යටත් පිරිසෙයින් තුන් මසක දායක මුදල් ද සමග ගරු ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍රය කළමනාකාර කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඉල්ලුම් පත්‍රය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කළමනාකාර කාරක සභාවට ඇත්තේ ය.

(2) යම් සාමාන්‍ය සාමාජිකයකු විසින් මාස හයක් හෝ ඊට වැඩි කාලයක් දායක මුදල් හිඟ තබා ඇති විටක ඔහුගේ නම සාමාජික ලේඛනයෙන් ඉවත් කළ හැකි අතර, ඔහුගේ නම එසේ ඉවත් කළ විට සාමාජිකයකු සතු අයිතිවාසිකම් සහ වරප්‍රසාද ඔහු විසින් භුක්ති විඳීම නතර වන්නේ ය. එසේ වුවද සියලු හිඟ මුදල් ගෙවා සාමාජිකත්වය යළි ලබා ගැනීමේ හිමිකම ඔහුට ඇත්තේ ය.

(3) සාමාන්‍ය සාමාජිකයකු විසින් ඔහුගේ සාමාජිකත්වය එක් පූර්ණ වර්ෂයක් පවත්වාගෙන යනු ලැබීමෙන් පසු සමිතියේ සාමාන්‍ය මහා සභා රැස්වීමක දී ඡන්දය දීමේ හිමිකම ඔහුට ලැබේ.

**සාමාජිකත්වය අත්හිටුවීම.**

3. යම් සාමාජිකයකුගේ හැසිරීම සමිතියේ යහපතට හානිකර අන්දමේ යයි දැනගන්නට ලැබුණු විටක, ඒ සාමාජිකයා වෙත යථා පරිදි දැනුම් දීමෙන් පසු කළමනාකාර කාරක සභාව විසින් පවත්වනු ලබන විමර්ශණයකින් පසු, කළමනාකාර කාරක සභාව විසින් ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ ඔහුගේ නම සාමාජික ලේඛනයෙන් ඉවත් කිරීම හෝ කරනු ලැබිය හැකිය. එසේ වුවද අදාළ සාමාජිකයා වෙත යථා පරිදි දැනුම් දීමෙන් පසු තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන සමිතියේ සාමාන්‍ය මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන්, යටකී තීරණය ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය යුතුය. ඉන්පසුව ඒ තීරණය අවසානාත්මක විය යුතුය.

**පුරප්පාඩු.**

4. නිලධරයන් අතර හෝ කළමනාකාර කාරක සභාවේ හෝ පුරප්පාඩුවක් වර්ෂය තුළ දී ඇති වූ අවස්ථාවක දී ඒ ධුරයේ නොගෙවී ශේෂ වී ඇති කාලය සඳහා ඒ පුරප්පාඩුව පිරවීමේ බලය කළමනාකාර කාරක සභාවට ඇත්තේ ය. එවැනි පත් කිරීම් සමිතියේ ඊළඟ මහා සභා රැස්වීමේ දී ස්ථිර කරනු ලැබිය යුතුය.

**පරිපාලනය.**

5. නිල බලයෙන් කළමනාකාර කාරක සභාවේ සාමාජිකයන් වූ සභාපතිවරයෙකුගෙන්, උපසභාපතිවරුන් තිදෙනකුගෙන්, ගරු ප්‍රධාන ලේකම්වරයකුගෙන්, ගරු භාණ්ඩාගාරිකවරයකුගෙන්, ගරු උපලේකම්වරයකුගෙන්, ගරු උපභාණ්ඩාගාරිකවරයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් පසළොස් දෙනකුගෙන් සමන්විත වූ කළමනාකාර කාරක සභාවක් විසින් සමිතියේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතුය. එකී සියලු දෙනාම සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කර ගනු ලැබිය යුතුය.

**නිලධරයන් තෝරා පත්කිරීම.**

6. (1) 5 වන වගන්තියේ සඳහන් සමිතියේ සියලු නිලධරයන් සහ කළමනාකාර කාරක සභාවේ අනෙකුත් සාමාජිකයන් සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී වර්ෂයක් පාසා තෝරා පත් කරගනු ලැබිය යුතුය. සමිතියේ සියලු නිලධරයන්ට යටත් පිරිසෙයින් එක් වර්ෂයක් සමිතියේ අඛණ්ඩ සාමාජිකත්වය තිබිය යුතු වේ.

(2) (1) වන ඡේදයේ සඳහන් නිලවලට තෝරා පත් කර ගනු ලැබීමට අපේක්ෂා කරන සියලු සාමාජිකයන් විසින්, යථා පරිදි සාමාජිකයන් දෙදෙනකු විසින් යෝජනා කරන ලද සහ ස්ථිර කරන ලද ලිඛිත නාම යෝජනා, වාර්ෂික මහා සභා රැස්වීමට යටත් පිරිසෙයින් දින හතකට පෙර ගරු ප්‍රධාන ලේකම්වරයා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. එවකටත් නිල දරන තැනැත්තන් විසින් තමා එවකට දරන නිලයටම නැවත තෝරා පත්කර ගනු ලැබීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. කළමනාකාර කාරක සභාවට තෝරා පත්කර ගනු ලැබීම සඳහා ද නාම යෝජනා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(3) වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුශාසකවරුන් දෙදෙනකු ද තෝරා පත් කර ගනු ලැබිය යුතුය.

**සභා රැස්වීම.**

7. (1) සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම හැකිතාක් දුරට එක් එක් වර්ෂයේ මැයි මාසයට ප්‍රථම පවත්වනු ලැබිය යුතුය. නිලධරයන් සහ කළමනාකාර කාරක සභාව එකී වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත් කර ගනු ලැබිය යුතුය. සුදුසුකම් ලත් විගණකවරයකු විසින් යථා පරිදි විගණනය කරනු ලැබූ ගිණුම් ප්‍රකාශයක් ගරු භාණ්ඩාගාරිකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින දහහතරකට කලින් සාමාජිකයන් වෙත භාර දෙනු ලැබිය යුතුය. යෝජනා හෝ ප්‍රශ්න යටත් පිරිසෙයින් දින හතකට කලින් ගරු ලේකම්වරයා වෙත භාර දිය යුතුය.

(2) සභාපතිවරයාගේ ඉල්ලීම පිට හෝ කළමනාකාර කාරක සභාවේ ඉල්ලීම පිට හෝ සමිතියේ සාමාජිකයන් යටත් පිරිසෙයින් විසිදෙනකුගේ ඉල්ලීම පිට හෝ යම් විශේෂ කරුණක් ගැන සාකච්ඡා කිරීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් පවත්වනු ලැබිය හැකිය. එවැනි රැස්වීමක් ගැන යටත් පිරිසෙයින් දින හතකට කලින් සාමාජිකයන් වෙත දැනුම් දිය යුතුය.

(3) කවර අවස්ථාවක හෝ අවශ්‍යතාවක් ඇති වුවහොත්, යටත් පිරිසෙයින් සතියක් කල් තබා සාමාජිකයන්ට දැනුම් දීමෙන් පසු සමිතියේ සාමාන්‍ය මහා සභා රැස්වීමක් ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් කැඳවනු ලැබිය හැකිය.

(4) කළමනාකාර කාරක සභාව යටත් පිරිසෙයින් මාසයකට වරක් රැස්විය යුතුය. යටත් පිරිසෙයින් දින තුනක් කල් තබා එවැනි රැස්වීමක් ගැන සාමාජිකයන්ට දැනුම් දිය යුතුය. ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් කළමනාකාර කාරක සභාවේ රැස්වීම් කැඳවිය යුතුය. සභාපතිවරයා විසින් හෝ යටත් පිරිසෙයින් සාමාජිකයින් හත් දෙනකු විසින් ඉල්ලා සිටි විටකදී කළමනාකාර කාරක සභාවේ රැස්වීමක් ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් කැඳවිය යුතුය. කළමනාකාර කාරක සභාවේ අනුයාත රැස්වීම් තුනකට පැමිණීම පිටපිටම පැහැර හරින ඒ කාරක සභාවේ සාමාජිකයකුගේ කාරක සභිකත්වය අවසාන වන්නේ ය.

**ගණපූරණය.**

8. සමිතියේ සාමාන්‍ය මහා සභා රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් විසිපස්දෙනකු පැමිණ සිටිය යුතු අතර, කළමනාකාර කාරක සභාවේ රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් එකොළොස් දෙනකු පැමිණ සිටිය යුතුය. ගණපූරණය නොමැතිවීම නිසා යම් රැස්වීමක් නොපවත්වනු ලැබූ විටක ඒ ආකාරයෙන්ම තදනන්තර රැස්වීමක් කැඳවා පවත්වනු ලැබිය හැකි අතර, එවැනි තදනන්තර රැස්වීමක් සඳහා ගණපූරණය, එය සාමාන්‍ය මහා සභා රැස්වීමක් නම් සාමාජිකයන් දහතුන් දෙනකුගෙන් ද කළමනාකාර කාරක සභාවේ රැස්වීමක් නම් සාමාජිකයන් හය දෙනකුගෙන් ද සමන්විත වන්නේ ය.

**සමිතියට අයත් දේපළ.**

9. (1) සමිතියට අයත් සියලු මුදල් සහ අරමුදල් ගරු භාණ්ඩාගාරිකවරයා විසින් භාර ගෙන සියලු ගිණුම් ඔහු විසින් තැබිය යුතු අතර, සමිතිය සහ කළමනාකාර කාරක සභාව විසින් බලය දෙනු ලැබූ ගෙවීම් ඔහු විසින් කරනු ලැබිය යුතුය.

(2) එක් වර්ෂයක දී රුපියල් විසිපන් දහසකට නොවැඩි මුදල් ප්‍රමාණයක් ගෙවීම සමිතිය විසින් සමිතියේ සාමාන්‍ය මහා සභා රැස්වීමක දී අනුමත කරනු ලැබිය හැකි අතර, කළමනාකාර කාරක සභාව විසින්, සමිතියේ අනුමතියට යටත් ව,

රුපියල් පන් දහසකට නොවැඩි මුදලක් එක් වර්ෂයක කාල පරිච්ඡේදය තුළ දී ගෙවීම අනුමත කරනු ලැබිය හැකිය. රුපියල් පිසිපන් දහසකට වැඩි කවර හෝ මුදලක් ගෙවීම සඳහා සමිතිය විසින් පාලක මණ්ඩලයේ පූර්ව අනුමතිය ලබා ගත යුතුය :

එසේ වුවද, ස්ථාවර තැන්පතුවලට එකතුවන පොලියෙන් මුදලින් ආධාරදීම, ශිෂ්‍යත්ව මුදල් සහ ආනුෂංගික වෙනත් වියදම් උදෙසා අධ්‍යාපන මණ්ඩලය විසින් කරනු ලබන ගෙවීම් විෂයෙහි ලා මෙකී සීමා කිරීම අදාළ නොවන්නේ ය.

(3) කළමනාකාර කාරක සභාවේ අනුමතියට යටත්ව රුපියල් පන් සියයකට නොවැඩි සම මුදලක් වියදම් කිරීමේ බලය ගරු ප්‍රධාන ලේකම්වරයාට හෝ ගරු භාණ්ඩාගාරිකවරයා සතු වේ.

(4) සමිතියේ සියලු මුදල්, සමිතිය විසින් අනුමත කරනු ලැබූ බැංකු ගිණුම් එකක හෝ ඊට වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය යුතුය. සමිතිය විසින් හෝ කළමනාකාර කාරක සභාව විසින් නියම කරනු ලබන ආකාරයට මුදල් ආපසු ගැනීම සඳහා වූ චෙක්පත් හෝ මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍ර ගරු භාණ්ඩාගාරිකවරයා විසින් සහ සභාපතිවරයා හෝ ගරු ප්‍රධාන ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

පාලක මණ්ඩලය සහ පාලක මණ්ඩලයේ රැස්වීම්.

10. (1) සමිතියේ සභාපතිවරයා විසින් පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවනු ලැබිය යුතුය. පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට එකී ඉල්ලීමේ දින සිට සති තුනක් ඇතුළත දී පාලක මණ්ඩලයේ රැස්වීමක් සමිතියේ සභාපතිවරයා විසින් කැඳවිය යුතුය.

(2) පාලක මණ්ඩලයේ ප්‍රථම රැස්වීමේ දී එහි සාමාජිකයන් විසින් ලේකම්වරයකු තෝරා පත් කර ගත යුතුය. සෑම රැස්වීමකදී ම, ඊට පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් කෙනකු ඒ රැස්වීමේ මූලසුන ගැනීමට තෝරා ගනු ලැබිය යුතු අතර, රැස්වීමක ගණපූරණය සඳහා යටත් පිරිසෙයින් සාමාජිකයන් හත් දෙනකු පැමිණ සිටිය යුතුය.

(3) රැස්වීමක් කැඳවීමේ දී ඒ රැස්වීම පිළිබඳව යටත් පිරිසෙයින් දින දහයක් කල් දී සමිතියේ සභාපතිවරයා විසින් පාලක මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත ලියුම් යැවිය යුතු අතර, පහත දැක්වෙන තොරතුරු ඒ ලියුම්වල අඩංගු වී තිබිය යුතුය :—

(අ) රැස්වීම පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ;

(ආ) අදාළ නිශ්චිත කරුණු මොනවාද යන්න සහ ඒ පිළිබඳ විස්තර.

(4) සමිතියේ හෝ අධ්‍යාපන මණ්ඩලයේ දේපළ සහ මුදල්වලට සම්බන්ධ සියලු කරුණුවල දී පාලක මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

රත්නපුර බෞද්ධ අධ්‍යාපන මණ්ඩලය.

11. (1) අධ්‍යාපන මණ්ඩලය විසින් පිහිටුවන ලද "බෞද්ධ අධ්‍යාපන අරමුදලට" රුපියල් පන්දහසක් හෝ ඊට වැඩි මුදලක් සම්මාදම් වශයෙන් දී ඇති හෝ මතුවට දෙන සියලු තැනැත්තෝ අධ්‍යාපන මණ්ඩලයේ සාමාජිකයන් වන්නාහ.

(2) සමිතියේ සභාපතිවරයා නිල බලයෙන් අධ්‍යාපන මණ්ඩලයේ සාමාජිකයෙක් වන්නේ ය.

(3) සමිතියේ සාමාජිකයන් අතුරෙන් දසදෙනකු එක් වර්ෂයක කාලයකට අධ්‍යාපන මණ්ඩලයට වර්ෂයක් පාසා ඇතුළත් කර ගැනීමේ අයිතිය අධ්‍යාපන මණ්ඩලයට ඇත්තේ ය.

මණ්ඩලයේ මුදල්.

12. (1) අධ්‍යාපන මණ්ඩලයේ ගරු භාණ්ඩාගාරිකවරයා ඒ මණ්ඩලයේ ගිණුම් භාරව සිටිය යුතු අතර, සුදුසුකම් ලත් විගණකවරයකු විසින් යථා පරිදි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් ගරු භාණ්ඩාගාරිකවරයා විසින් අධ්‍යාපන මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

(2) අධ්‍යාපන මණ්ඩලයේ රීතිවලට අනුකූලව බැංකුවෙන් මුදල් ආපසු ගැනීම සඳහා වූ සියලු චෙක්පත් සහ ආකෘති පත්‍ර ගරු භාණ්ඩාගාරිකවරයා විසින් සහ අධ්‍යාපන මණ්ඩලයේ සභාපති සහ ගරු ලේකම් යන දෙදෙනාගෙන් එක්කෙනෙකු විසින් ද අත්සන් කරනු ලැබිය යුතුය.

[illegible]

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. [illegible] (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ [illegible] සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා [illegible] මිලදී ගැනීම සඳහා ඒවා ලබාගත හැකිය. [illegible]